www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# අන්තර්ජාලයය වාරනය කිරීමේ කුමන්ත්‍රනය

The conspiracy to censor the Internet

**2017 ඔක්තෝබර් 18**

ඇමරිකානු පාලක පන්තියේ දේශපාලන නියෝජිතයෝ නිදහස් භාෂනය මර්දනය කිරීමට කුමන්ත්‍රනයක නියලී සිටිති. චෝදනා කෙරෙන පරිදි රුසියාව විසින් පාලනය කරනු ලබන "අලයින් (trolls)" හා "ව්‍යාජ ප්‍රවෘත්තිවලට" එරෙහිව සටන් කිරීමේ රුවටිල්ල යටතේ, පලමුවැනි සංශෝධනය තුල සහතික කෙරුනු ඉතාමත් මූලික ව්‍යවස්ථාදායක අයිතීන් ඍජු ප්‍රහාරයකට යටත් කෙරේ.

මෙම උද්ඝෝෂනය තුල ප්‍රධාන දේශපාලන බලවේගය වන්නේ, රිපබ්ලිකානු පක්ෂයේ කන්ඩායම්, ජන මාධ්‍ය හා මිලිටරි - ඔත්තුසේවා සංස්ථාපිත සමග සහයෝගයෙන් වැඩ කරමින් සිටින ඩිමොක්‍රටික් පක්ෂය යි.

ට්‍රම්ප් පාලනාධිකාරිය උතුරු කොරියාවට එරෙහිව න්‍යෂ්ටික යුද තර්ජන කරමින් සිටින්නේ, සෞඛ්‍ය රැකවරනය මත ප්‍රහාරය උත්සන්න කරමින්, පොහොසතුන් වෙනුවෙන් නව බදු කප්පාදු ඉල්ලමින්, සංක්‍රමනික කම්කරුවන්ට එරෙහිව යුද වදිමින්, හා සංගත හා පාරිසරික නියාමනයන් ශුද්ධ කර දමමිනි. කෙසේ නමුත්, ඩිමොක්‍රටික් පක්ෂයේ එල්ලය මෙම ප්‍රතිගාමී න්‍යායපත්‍රය නො වේ. ඒ වෙනුවට එය සංකේන්ද්‍රනය වෙමින් සිටින්නේ රුසියාව එක්සත් ජනපදය තුල "බෙදීම් වපුරමින් සිටිතැ යි" යන වඩ වඩා උන්මාදනීය ප්‍රකාශ මත ය.

මාධ්‍ය තුල එක වාර්තාවකට පසු තව එකක් පල කෙරෙන්නේ එක එකක් අවසාන එකට වඩා හාස්‍යජනක වන ලෙස ය. ෆේස්බුක් හා ට්විටර් හි ඩොලර් 100,000ක දැන්වීම් වල ආධාරයෙන් රුසියාව එක්සත් ජනපද මැතිවරනය වෙනස් කලේ ය යන ප්‍රකාශය පසු පස පැමින ඇත්තේ පුටින් ආන්ඩුව විසින් සංනිවේදනයේ අනෙකුත් රූපාකාරයන් හැසිරවීම් සම්බන්ධ විස්මිත වාර්තාවන් ය.

කරුනු ඉදිරිපත් කිරීමකින් තොරව රුසියාව සම්බන්ධ යැයි චෝදනා කෙරෙන, "අපට වෙඩි නො තබනු" ("Don't Shoot Us") නම් එක් සංවිධානයක්, ඉන්ස්ටග්‍රෑම්, ට්විටර්, යූටියුබ්, ටම්බ්ලර්, හා පොකේමොන් ගෝ නම් ජංගම දුරකතනවල ක්‍රීඩා කරන රියලිටි ෂෝ මත පවා "වාර්ගික ආතතීන් ගසා කෑමට හා අසමගිය වැපිරීමට" උත්සාහ කරන බව පසු ගිය සතියේ සීඑන්එන් "විශේෂ" වාර්තාවක් ප්‍රකාශ කලේ ය.

තවත් සීඑන්එන් වාර්තාවක් සඳුදා තහවුරු කලේ "2016 මැතිවරනයට බලපෑමට ව්ලැඩිමීර් පුටින් ගෙන ගිය උද්ඝෝෂනයේ කොටසක්" ලෙස රුසියානු "අල ෆැක්ටරියක්" හිලරි ක්ලින්ටන්ට තීරනාත්මක වන අදහස් දැක්වීම් පලකිරීමේ හි නියැලී සිටි බව යි. ප්‍රවෘත්ති මාධ්‍ය හා අනෙකුත් මාධ්‍යවල ක්ලින්ටන් වෙත එල්ල කෙරුනු සියලු ම අශුභවාදී අදහස් දැක්වීම්, රුසියානු ඒජන්තයින්ගේ හෝ රුසියානු ඒජන්තයින් විසින් මුලා කෙරුනු පුද්ගලයන්ගේ නිෂ්පාදන බව එය ඇඟවී ය.

සීතල යුද්ධ සමයේ මැකාතිවාදී කාලපරිච්ඡේදය අතරතුර දී මෙන්, චෝදනාවල විකාරත්වය අනභියෝගිව වැජඹේ. අනෙකුත් මාධ්‍ය හොරනෑ හා දේශපාලඥයින් විසින් ඒවා ඩැහැගෙන පුනරුච්චාරනය කරන්නේ අතිදුෂ්ට "විදේශ හතුරාගේ" ක්‍රියාවන් සැබවින් ම කොතරම් දුර යන්නේ දැ යි ප්‍රදර්ශනය කිරීමට ය.

රුසියානු විරෝධී විදේශ ප්‍රතිපත්තිය ඉදිරියට ගෙන යාම හා තීව්‍ර කිරීම එක් අරමුනක් වී ඇති අතර, හැම විටම වඩාත් පැහැදිලි ව ඉස්මතු වන වඩා මූලික අරමුන වන්නේ: එක්සත් ජනපදය තුල දේශපාලනික විරෝධතා සාපරාධී ලෙස නම් කිරීම යි.

අද වන විට භාෂනයට එරෙහිව මෙම කුමන්ත්‍රනයේ වඩාත් ම ඍජු ප්‍රකාශනය දී ඇත්තේ කොමියුනිස්ට් විරෝධී පරමාදර්ශී න්‍යායවාදිනියක වන ඈන් ඇපල්බෝම් විසිනි. සඳුදා *වොෂින්ටන් පෝස්ට්* පත්‍රයේ ප්‍රසිද්ධ කෙරුනු තීරු ලිපියක් තුල ඇය මෙසේ ඇසුවා ය, "රුසියාවට 'කලු ජීවිත වටී (black lives matters) වැනි ව්‍යාජ ගිනුම් නිර්මානය කල හැකි නම්, ර ලඟට කවුරුන් ද?"

ඇගේ පිලිතුර: ඇමරිකානු ජනතාව යි. "මට බොහෝ කන්ඩායම් ගැන සිතිය හැක, ඔවුන් බොහොමයක් ආඩම්බර ඇමරිකානුවන්, කැරල්ලක් හෝ ව්‍යසනයක් අතරතුර උද්වේගය හා භිය වැඩි කිරීමට ව්‍යාජ ප්‍රවෘත්ති මාලාවක් හැසිරවීමට ඔවුන්ට අවශ්‍ය වනවා විය හැකි"යි ඈ ලිය යි. දේශපාලනික කන්ඩායම් (වාමාංශිකවේවා දක්ෂිනාංශිකවේවා, ඔබට කැමති ලෙස නම් කරනු මැනවි) "අසත්‍ය තොරතුරු" හා "අධෛර්ය කිරීම්" පතුරුවා හැරීමට සාමජ මාධ්‍ය යොදා ගන්නේ කෙසේ දැ යි "ඉක්මනින් ම ඉගෙන ගනු ඇතැ" යි ඈ අනතුරු අඟවන්නීය.

ඔවුන්ගේ ඔන්ලයින් අනන්‍යතාව වසන් කිරීමට උත්සාහ කරන සියල්ලන්ට එරෙහිව ඇපල්බෝම් නින්දා කර යි. "නිර්නාමිකත්වයට එරෙහිව, අඩු වසයෙන් සමාජ මාධ්‍යවල ප්‍රසිද්ධ සංසඳ හා අදහස් දැක්වීම් අංශවල නිර්නාමිකත්වයට එරෙහිව අන් කවරදාටත් වඩා හොඳ තත්වයක් තිබේ" යයි ඇය ලිය යි. "නිදහස් භාෂනයේ අයිතිය මිනිසුන්ට මිස, පරිගනක ක්ෙත කීපයකට ප්‍රදානය කෙරුනා නො වේ" යයි ඇය තව දුරටත් පවසන්නීය. කෙසේ වෙතත්, ඇගේ ඉලක්කය වන්නේ "ව්‍යාජ ප්‍රවෘත්ති" හසුරුවන "අන්තර්ජාල රොබෝ" ("bots") නො වේ, නමුත් රාජ්‍ය මර්දනයට බිය

වෙමින් නැතහොත් ඔහුගේ හෝ ඇයගේ හාම්පුතාගේ අසාධාරන දඬුවම්වලට එරෙහිව නිර්නාමික ප්‍රකාශනයක් කිරීමට උත්සාහ ගන්නා ඕනෑම අයෙකු ය. එමෙන් ම එය දේශපාලන විරෝධය නිහඬ කිරීමට වන තල්ලුවේ ආරම්භක වෙඩිල්ල පමනක් වන්නේ ය.

ඇපල්බෝම් ධනේශ්වර රාජ්‍යයේ ඉහල ම සමාජ ස්ථරයන්ට කිට්ටු සම්බන්ධකම් ඇති අයෙකි. ඇය ප්‍රධාන විදේශ ප්‍රතිපත්ති බුද්ධි මන්ඩලවල සාමාජිකාවක වන අතර සීඅයිඒ සංවිධානයට බැඳුන ප්‍රජාතන්ත්‍රවාදය සඳහා ජාතික අනුරක්ෂනයේ (National Endowment for Democracy) අධ්‍යක්ෂ මන්ඩලයේ වාඩි ගනී. පෝලන්තයේ හිටපු විදේශ ඇමති සමග විවාහ වූ ඇය, බියකරු යුද ලිහිනියෙකි. රුසියාව ක්‍රිමියාව ඈඳා ගැනීමෙන් අනතුරුව, *වොෂින්ටන් පෝස්ට්* හි තීරු ලිපියක් ලියූ ඇය, එය තුල න්‍යෂ්ටික ව සන්නද්ධ රුසියාවට එරෙහිව "පූර්න යුද්ධයක්" ඉල්ලා සිටියා ය. ඇය මූර්තිමත් කරන්නේ මිලිටරිවාදය හා දේශපාලනික මර්දනය අතර සම්බන්ධය යි.

ඇපල්බෝම්ගේ තර්කයේ ගම්‍යයන් පැහදිලි කෙරෙන්නේ අඟහරුවාදා *නිව් යෝක් ටයිම්ස්* පත්‍රයේ ඉදිරි පිටුවේ පල කෙරෙනු, "එක්සත් ජනපදය අන්තර්ජාල කඩාකප්පල් කිරීම්වලට අභිමුඛ වනවිට, චීනය නිර්දෝෂී බව ඇඟවෙයි." යන අත්‍යාසමාන ලිපියක් තුල ය, මෙය චීනයේ ආක්‍රමනකාරී අන්තර්ජාල වාරනය සම්බන්ධයෙන් පක්ෂපාතී අදහසක් ගන්නා අතර එක්සත් ජනපදය හුදෙක් එවැනි පාලනයක් දෙසට ගමන් කරමින් සිටින බව ගම්‍ය කර යි.

"වසර ගනනාවක්, එක්සත් ජනපදය හා අනෙකුත් අය" චීනයේ "ආධිපත්‍යදාරී වාරනය දුටුවේ දේශපාලනික දුර්වලත්වයේ සංඥාවක් මෙන් ම චීනයේ ආර්ථික වර්ධනයට බාධාවක් ලෙස ය"යි *ටයිම්ස්* සඳහන් කර යි. "නමුත් බටහිර රටවල් ශක්‍ය අන්තර්ජාල සීමාවන් සාකච්ජා කරන අතර ව්‍යාජ ප්‍රවෘත්ති, හැක් කිරීම් හා විදේශීය ඇඟිලි ගැසීම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අත් පටලවා ගැනීමත් සමග, චීනයේ ඇතම්හු අන්තර්ජාලය සම්බන්ධ චීනයේ දැක්ම ඉන් බලගතු ලෙස තහවුරු වූ බවක් දකිති."

"චීනයේ අන්තර්ජාල පාලනය ප්‍රජාතන්ත්‍රවාදී සමාජවලට ආදර්ශයක් ලෙස ඇතැමුන් තර්ක කරනු ඇත...ඒ අතරම, චීනය එක්සත් ජනපදයේ සිට ජර්මනිය, ඉන්දුනීසියාව දක්වා ආන්ඩු මේ වන විට කලබල කරවමින් තිබෙන බොහෝ ප්‍රශ්න පෙරදැක්කේයැ"යි තහවුරු කිරීමට ලිපිය ඉදිරියට යයි.

ඇපල්බොම්ගේ අදහස් දැක්වීම් හා සමාජ මාධ්‍ය මත කඩා පැනීමක් සඳහා වන අවසානයක් නැති සියලු ඉල්ලීම් සහිත *ටයිම්ස්* ලිපියේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන්, නිදහස් භාෂනය හා පලමුවැනි සංශෝධනය ගැන කිසියම් හෝ සඳහනක් කිසිසේත් දක්නට නොමැත.

"...භාෂනයේ නිදහස සීමා කරමින් කොංග්‍රසය නීති නො පැන විය යුතු යයි" සහතික කරන පලමුවැනි සංශෝධනය, එක්සත් ජනපද ව්‍යවස්ථාවේ පුලුල් ම සංශෝධනය යි. ඇපල්බෝම්ට පටහැනි ලෙස, ව්‍යවස්ථාදායක ආරක්ෂාවෙන් නිර්නාමිකත්වය අත හැර දැමෙන තහනමක් එහි නොමැත. ඇමරිකානු විප්ලවයේ නායකයන් හා ව්‍යවස්ථාව කෙටුම්පත් කල අය තමන් බ්‍රිතාන්‍ය අධිකාරීන් විසින් මර්දනය කිරීම මග හැරීමට, ව්‍යාජ නම් යටතේ ලිපි ලියූ බව ඓතිහාසික කාරනයකි.

"ව්‍යාජ" කුමක් ද එමෙන් ම නොවන්නේ කුමක් ද, "කුමන්ත්‍රන න්‍යායක්" යනු කුමක් ද හා "ආධිකාරික" කුමක්ද යන්න ප්‍රකාශ කිරීමට ව්‍යවස්ථාව ආන්ඩුවට, හෝ බලගතු සංස්ථාවන්ට අයිතිය නො දෙයි. සමාජ මාධ්‍ය මත කඩා පැනීමට දැන් යොදා ගැනෙන තර්ක ම මුද්‍රන යන්ත්‍රවල වර්ධනයත් සමග මතු වූ පොත් හා විශාල ලෙස බෙදා හැරි ප්‍රවෘත්ති පත්‍ර මර්දනය කිරීමට යොදා ගැනීමට හොඳටම පුලුවන්කම තිබෙන්නට ඇත.

එක්සත් ජනපදය තුල අන්තර්ජාල වාරනය වෙතට වන ගමන දැනටමත් බොහෝ ඉදිරියට ගොස් ඇත. මෙම වසර මුල දී ගූගල් ගවේෂන ප්‍රතිඵල තුල "විකල්ප දෘෂ්ටිවාදයන්" වැලලීමේ සැලසුම් නිවේදනය කිරීමේ තැන් සිට, ඔවුන්ගේ ගවේෂන ප්‍රතඵල සියයට 50කින් වැටී ඇති බව ප්‍රධාන වාමාංශික වෙබ් අඩවි හඳුනා ගෙන ඇත. *ලෝක සමාජවාදී වෙබ් අඩවියට* ගූගල්වලින් එන සන්නිවේදන හුවමාරු සියයට75 කින් පහල ගොස් ඇත.

ෆේස්බුක්, ට්විටර් හා අනෙකුත් සමාජමාධ්‍ය වේදිකා ද ඒ ආකාරයේ ම පියවර හඳුන්වා දී ඇත. රුසියානු ඔන්ලයින් ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් උත්සන්න කෙරී ඇති උද්ඝෝෂනය ඊටත් වඩා දුර යන පියවර යුක්තිසහගත කිරීමට පාවිච්චි කෙරෙනු ඇත.

විශ්වවිද්‍යාලවල සිදුවීම් සුපරික්ෂා කිරීම සඳහා පොලිසියට අධිකාරිත්වය දීමට විශ්වවිද්‍යාල විසින් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමත් සමග මෙය සිදුවෙමින් තිබේ. ඒ මගින් යෝධ සමාගම්වලට අන්තර්ජාල සන්නිවේදන නියාමනය කිරීමේ හැකියාව ලබා දෙන "ජාල අපක්ෂපාතිත්වය" තුරන් කිරීම සඳහා ඉදිරියට යන උත්සාහයන් තිබේ. සමස්ත ජනතාවගේ ම දුරකතන සන්නිවේදන හා අන්තර්ජාල ක්‍රියාකාරකම් නීති විරෝධී ව අධීක්ෂනය කිරීම සම්බන්ධයෙන් හෙලිදරව් කරන ලදුව ඔත්තුසේවා ඒජන්සි දත්ත කේතනය කිරීම මග හැරීමේ හැකියාව ඉල්ලා ඇත.

ප්‍රන්සයේ ස්ථාවර හදිසි නීති තත්වයේ සිට, පසු ගිය මාසයේ දී ඉන්ඩිමීඩියා නම් වාමාංශික දේශාපාලනික අඩවියේ අනු-සමාගමක් වසා දැමූ ජර්මනිය, කැටලෝනියාවේ බෙදුම්වාදී ජනමත විචාරනයට කඩා පනිමින් බෙදුම්වාදී නායකයන් අත්ඩංගුවට ගත් ස්පාඤ්ඤය දක්වා "ප්‍රජාතන්ත්‍රවාදී" රටවල් එකක් පසුපස එකක් සිය ආන්ඩු පොලිස් රාජ්‍ය රූපාකරයන්ට මාරු කරමින් සිටිති.

ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් විනාස කිරීම යනු සමාජ අසමානතාවේ වර්තා ගත මට්ටම් සමග බැඳුනු කම්කරු පන්තියේ අතෘප්තිය වර්ධනය වීමට එරෙහිව දේශපාලන සංස්ථාපිතය හා සංගත හා මූල්‍ය කතිපයාධිකාරිත්වයේ දේශපාලනික ප්‍රතිචාරය යි. එය සම්පව බැඳෙන්නේ ලෝකය පුරා අධිරාජ්‍යවාදී ප්‍රචන්ඩත්වයේ ප්‍රධාන උත්සන්න කිරීමක් සඳහා වන සූදානම්වීම්වලට ය. පාලක පන්තිය විශාල වශයෙන් සැලකිලිමත් වන්නේ කම්කරු පන්තියේ ස්වාධීන ව්‍යාපාරයක මතුවීම පිලිබඳව වන අතර රාජ්‍ය ඒවා වැලක්වීමට පියවර ගනිමින් සිටී.

ආන්ද්‍රේ ඩමොන් හා ජෝශප් කිෂෝර්

© www.wsws.org